සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**6 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **11 S I**

නම: ..........................................

## බුද්ධ ධර්මය

**කාලය පැය දෙකයි**

- **සැළකිය යුතුයි.**
- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01) සිදුහත් කුමරුගේ සුළු මව වූයේ,
1. මහාමායා දේවිය 2. මහා ප්‍රජාපතී දේවිය 3. යසෝදරා දේවිය 4. බිම්බා දේවිය

02) පෙර අත්බව සිහිකිරීමේ නුවණ,
1. ආසවක්ඛය ඥාණය යි 2. විදර්ශනා ඥාණය යි 3. චුතුපපාත ඥාණය යි 4. ජාතිස්මරණ ඥාණය යි

03) දුමින්දාගමනය සිදුවූයේ,
1. වෙසක් පෝ දිනය 2. පොසොන් පෝ දිනය 3. ඇසළ පෝ දින 4. උදුවප් පෝ දිනය

04) සුගන්ධිකාය වදනං ....................................... යන ගාථාව කියමින් පුජා කරන්නේ,
1. සුවඳ දුම් 2. පැන් 3. දැහැත් 4. ගිලන්පස

05) ශික්ෂා කාමී භික්ෂූන් අතර අගතනතුරු දැරුවේ,
1. ආනන්ද හිමි 2. සැරියුත් හිමි 3. රාහුල හිමි 4. මිහිඳු මාහිමි

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06) අනුන්ගේ දියුණුව දැක සතුටුවීම උපේක්ෂාවයි ( )

07) වෙනස් වීම බුදුදහමෙන් ''දුක්ඛ'' ලෙස හඳුන්වයි ( )

08) ශ්‍රී ලංකාවේ මුලින්ම පැවිදි වු කාන්තාව ප්‍රජාපති දේවියයි ( )

09) බුද්ධ කාලයේ සිටි දක්ෂ වෛද්‍යවරයෙකි ජීවක වෙද මහතා ( )

10) ලෝක පරිසර දිනය ඔක්තෝම්බර් 01 දාය ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන වචනය වරහන තුළ ඇති වචන වලින් තෝරා ලියන්න.**

(අසිත/ ථූපාරාමය/ භණ්ඩුක/ අරිට්ඨ/ බොරුකීමෙන් වැළකීම)

11) අප රට ඉදිකළ මුල්ම ස්තුපය ................................................ චෛත්‍යයයි.

12) මිහිඳු මාහිමි සමඟ මෙරටට පැමිණියේ ................................ උපාසක තුමාය.

13) ....................................... සම්මා වාචාවට අයත් මාර්ග අංගයකි.

14) සිදුහත් බෝසත් කුමරුට සුදොවුන් රජු පළමු වරට වැන්දේ ............................... තාපස තුමාට කුමරු පෙන්වු දිනයි.

15) ශ්‍රී ලංකාවේ පළමුවෙන්ම පැවිදි වූයේ ............................... කුමරුය.

● අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල A කොටසට අදාළ පිළිතුරු B කොටසින් තෝරා ඉරකින් යා කරන්න.

| | |
|---|---|
| 16) නිරෝගී බව | සීලං |
| 17) සිල්වත් බව | ආරෝග්‍ය |
| 18) බුදුතෙමඟුල | සථිකාර බමුණා |
| 19) බෝසත්තුමාට පළමුව සිවුරු පූජා කළේ | පොසොන් පෝ දින |
| 20) මිහිඳු මාහිමි | වෙසක් පෝ දින |

## II කොටස

● පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01) i. යසෝදරා දේවියගේ පියාගේ නම ලියන්න.
ii. රාහුල කුමරු පැවිදි කළේ කවුරුන් ද?
iii. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි. මෙහි තේරුම නිවැරදිව ලියන්න.
iv. දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න.
v. මිහිඳු මා හිමි සමඟ අපේ රටට වැඩම කළ රහතන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න.
vi. ''බුදුබව ලබා පළමුව මාගේ රාජ්‍යයට වැඩම කරන්න'' යැයි ඉල්ලා සිටි රජතුමා කවුද?
vii. වප් මඟුල් දින සිදුහත් කුමරු වැඩු භාවනාව කුමක් ද?
viii. දියුණුවේ දොරටු 06 ක් පෙන්වා දුන් ජාතක කතාවේ නම ලියන්න.
ix. වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිත්තිතං...... ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න.
x. ''අන්තුපතායික ධර්ම පර්යාය'' යනු කුමක් ද? (ල. 2 බැගින්)

02) i. ඔබ විහාරස්ථානයට යන විට රැගෙන යන දේවල් හතරක් ලියන්න.
ii. විහාරස්ථානයේ දී වන්දනා කරන ස්ථාන තුන පිළිවෙලින් ලියන්න
iii. පන්සිල් පද පහ පිළිවෙලින් ලියන්න.

03) i. සම්මා වාචා යනු කුමක් ද?
ii. වචනයෙන් සිදුවන අකුසල් තුනක් ලියන්න.
iii. සිල්වත්ව කටයුතු කිරීමේ ආනිසංස 05 ක් ලියන්න.

04) i. නතං කම්මං කතං සාධු ......... ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එහි තේරුම ලියන්න.
iii. ඔබට මුහුණ දීමට සිදුවු අමිහිරි අසතුටුදායක ක්‍රියාවක් විස්තර කරන්න.

05) i. ලෝක පරිසර දිනය කවදා ද?
ii. පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.
iii. පරිසරය පිරිසිදුව තබා ගැනීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියා 05 ක් ලියන්න.

06) i. ථූපාරාම චෛත්‍යය ඉදිකළ රජතුමා කවුද?
ii. බෝධි ආගමනය හෙවත් දුමින්දාගමනය යනුවෙන් කුමක් අදහස්වේ ද?
iii. මහින්දාගමනයෙන් අප ලද දායාද 05 ක් ලියන්න.

07) i. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය පෙන්නුම් කරන සංකේත 02 ක් ලියන්න.
ii. ජාතික කොඩියෙහි ඇතුළත් අංග තුනක් ලියන්න.
iii. ජාතික කොඩියට ගරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 05 ක් ලියන්න.